**රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදල- 2013**

-----------------------------------------------------

රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1953 අංක 36 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදල් පනතේ (437 අධිකාරිය) 6 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අහිතකර මතය සඳහා පදනම**

**-----------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**2.1 අහිතකර මතය**

**---------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------------**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රබර් නැවත වගා කිරීමේ අරමුදලට අයත් රු.63,438,233 ක් පිරිවැය වූ ස්ථාවර වත්කම් භෞතිකව හඳුනාගෙන නොතිබූ අතර මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා නොකරන මෙම වත්කම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.827,880 ක් ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හා රඳවා ගැනීමේ බදු අඩු කිරීම් සැලකිල්ලට නොගැනීම හේතුවෙන් ස්ථාවර තැන්පතු පොළී ආදායම ලෙස රු.110,849 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) විගණන ගාස්තු වෙනුවෙන් කරන ලද පූර්ව ගෙවීම් නොසලකා ප්‍රතිපාදන සිදුකිරීම නිසා රු.1,061,126 ක අධි ප්‍රතිපාදනයක් සිදුකර තිබුණි.

(ඈ) ඒකාබද්ධ අරමුදලට බැරකර තිබූ රු.70,659,527 ක් රබර් නැවත වගාකිරීමේ අරමුදලෙන් අඩුකර දක්වනවා වෙනුවට එය ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

පහත සඳහන් විෂයයන් සනාථ කර ගැනීම සඳහා කිසිඳු සාක්ෂියක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| විෂයය | වටිනාකම |
|---|---|
| | රු. |
| ස්ථාවර වත්කම් | 63,438,233 |
| ජංගම වත්කම් | 157,595,843 |
| ජංගම වගකීම් | 18,868,118 |
| අයකරගත යුතු අත්තිකාරම් | 15,220,514 |

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.84,522 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ රු.383,580 ක ඌනතාවයක් වූයෙන් පසුගිය වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.468,102 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

**3.2 කාර්යය සාධනය**

--------------------

**3.2.1 අරමුදලේ පැවැත්ම**

---------------------

ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින මෙම අරමුදල ඇවර කිරීම පිණිස අදාල පනතේ විධි විධාන අනුව හා 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කළ විගණිත ගිණුම්හි දැක්වෙන වත්කම් හා වගකීම් නිරවුල් කර අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් අරමුදල ඇවර කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අමතන ලද 2011 ඔක්තෝබර් 21 දිනැති PF/Fd/04/47 දරන ලිපියෙන් දැනුම් දී තිබුණි. කෙසේ වුවද 2014 ජුනි 23 දින දක්වාම ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**4. පද්ධති හා පාලනයන්**

**----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) අත්තිකාරම් පියවීම
(ඇ) ණයගැති / ණයහිමි පාලනය
(ඈ) ස්ථාවර වත්කම් පාලනය